2008 අංක 05 දරණ

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත මූල්‍යාධාර සැපයීම

සඳහා වූ ප්‍රඥප්තිය

නම් වූ

මෙම ප්‍රඥප්තිය

2008 සැප්තැම්බර් මස 23 වන දින පැවති

බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීමේදී

සභා සම්මත වූ බව

සහතික කරමි

දිනය : 2008 . 11 . 04 .

ජගත් අංගගේ,
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

ජගත් අංගගේ
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
[illegible]
[illegible] 07.

දිනය : 2008 . 11 . 07

එස්. අලවි මව්ලානා,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත

එස්. අලවි මව්ලානා
බස්නාහිර පළාතේ
ආණ්ඩුකාරවර

**කෙටුම්පත**

*1990 අංක 06 දරණ බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය යටතේ අය කරනු ලබන මුද්දර ගාස්තුවල වාර්ෂික ලැබීම් ප්‍රමාණය සැලකිල්ලට ගෙන බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත මූලාධාර සැපයීම හා 1992 අංක 05 දරන මුද්දර ගාස්තු පැවරීම සඳහා වූ ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**ලුහුඬු නාමය**

1. මේ ප්‍රඥප්තිය ....2008........ අංක ....05........ දරණ බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත මූලාධාර සැපයීම සඳහා වූ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර මේ ප්‍රඥප්තිය ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන්නා වූ දිනට පසුව එළඹෙන වර්ෂයේ ජනවාරි පළමු දින සිට බලාත්මක වන්නේ ය.

**අරමුණ.**

2. 1990 අංක 06 දරණ බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය හා 1991 අංක 05 දරණ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යටතේ පළාත් සභාව විසින් පනවා අය කරනු ලැබ, බස්නාහිර පළාතේ පළාත් සභා බල ප්‍රදේශ සීමාව තුළ පිහිටි යම් නිශ්චලවල දේපල පැවරීමක් සඳහා අය කරනු ලැබූ යම් මුද්දර ගාස්තුවක්, එකී මුද්දර ගාස්තු අයකළ ලිත් වර්ෂයට පසුව එළඹෙන දෙවන ලිත් වර්ෂය තුළදී, පහත 3 වගන්තිය යටතේ නිල බලයෙන් පත් වනු ලබන පළාත් පාලන ආයතන වෙත මූලාධාර සැපයීම සඳහා වූ කමිටුව (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) විසින් තීරණය කරනු ලබන්නා වූ යම් මුදල් ප්‍රමාණයක් බස්නාහිර පළාතේ එක් එක් පළාත් පාලන ආයතන වෙත මූලාධාරයක් ලෙස පවරා දීම සඳහා විධිවිධාන සලසනු පිණිස සහ බස්නාහිර පළාතේ 1992 අංක 05 දරන මුද්දර ගාස්තු පැවරීම සඳහා වූ ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම පිණිස වූ ප්‍රඥප්තියකි.

**කමිටුවේ සංයුතිය**

3. ප්‍රධාන ලේකම්, පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්, පළාත් පාලන කොමසාරිස් , නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) සහ පළාත් ආදායම් කොමසාරිස් යන නිලයන් දරන තැනැත්තන් කමිටුවේ සාමාජිකයන් විය යුත්තේ ය. ප්‍රධාන ලේකම් එකී කමිටුවේ සභාපතිවරයා ද වන්නේ ය.

**කමිටුවේ කාර්යයන් හා වගකීම**

4. (1) ඉහත 2 වගන්තියේ නිශ්චිතව සඳහන් ලිත් වර්ෂයක් තුළදී, ඊට ලිත් වර්ෂ දෙකකට පෙර පළාත් සභා අරමුදලට රැස් කරනු ලැබ ඇත්තා වූ මුද්දර ගාස්තු ආදායම් ප්‍රමාණයෙන්, බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත වෙන්කර දිය යුතු සමස්ථ මූලාධාර ප්‍රමාණය හා එකී නිශ්චිතව සඳහන් ලිත් වර්ෂය තුළදී 3 වන උප වගන්තියේ සඳහන් අරමුණ සඳහා එක් එක් පළාත් පාලන ආයතනක් වෙත ලබා දිය යුතු මූලාධාර ප්‍රමාණය තීරණය කිරීම කමිටුවේ කාර්යය හා වගකීම වන්නේ ය.

(2) ඉහත (1) උප වගන්තිය යටතේ කමිටුව විසින් බස්නාහිර පළාතේ සියළුම පළාත් පාලන ආයතන වෙත වෙන් කර දීමට තීරණය කරනු ලබන්නා වූ සමස්ථ මූලාධාර ප්‍රමාණය එම උප වගන්තියේ නිශ්චිතව සඳහන් ලිත් වර්ෂය තුළදී පළාත් සභා අරමුදලට රැස් කරනු ලැබ ඇත්තා වූ මුද්දර ගාස්තු ආදායම් ප්‍රමාණයෙන් අඩකට වඩා අඩු නොවිය යුත්තේ ය.

(3) බස්නාහිර පළාතේ පිහිටි පළාත් පාලන බල ප්‍රදේශ තුල තුල්‍ය ප්‍රාදේශිය සංවර්ධනයක් අත්පත් කර ගැනීම හා වැඩිදියුණු කිරීම අරමුණු කර කමිටුව විසින් එක් එක් පළාත් පාලන ආයතනයක් වෙනුවෙන් යම් ලිත් වර්ෂයක් සඳහා වෙන් කර දිය යුතු මූලාධාර ප්‍රමාණය (4) හා (5) වන උප වගන්තිවල සඳහන් විධිවිධාන වලට යටත්ව තීරණය කළ යුත්තේ ය.

(4) එක් එක් පළාත් පාලන ආයතනයක් වෙත යම් ලිත් වර්ෂයක් වෙනුවෙන් වෙන් කර දෙනු ලබන මූලාධාර ප්‍රමාණය.-

(අ) එක් එක් පළාත් පාලන බල ප්‍රදේශයක් තුල පිහිටි ඉඩම්, හුවමාරු කිරීමේදී එම හුවමාරු වූ ඉඩම් වෙනුවෙන් අය කරනු ලැබූ මුද්දර ගාස්තු ප්‍රමාණයේ අනුපාතය;

අනුමැතිය මම දෙමි

2008/11/07

බස්නාහිර පළාත.

(ආ) එක් එක් පළාත් පාලන ආයතන විසින් ආදාළ ලිත් වර්ෂය තුල එකී පළාත් පාලන ආයතනයට නීතියෙන් නියම කර ඇති ආදායම් විෂයයන් යටතේ රැස් කර ගනු ලැබ ඇති ආදායම් ප්‍රමාණය හා එම වර්ෂය තුළ ලැබිය යුතුව තිබූ ආදායම් ප්‍රමාණය අතර ප්‍රතිශතය සහ

(ඇ) එක් එක් පළාත් පාලන බල ප්‍රදේශය අතර පවත්නා ආර්ථික විෂමතා අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාවය

මත තීරණය කළ යුතු ය.

(5) මෙහි (4) වන උප වගන්තියේ "ඇ" අනු වගන්තිය යටතේ පළාත් පාලන ආයතන වෙත වෙන් කර දෙනු ලබන මූලාධාර ප්‍රමාණය (2) වන උප වගන්තිය යටතේ ගණනය කළ සමස්ථ මූලාධාර ප්‍රමාණයෙන් 10% ක ප්‍රමාණයට වඩා වැඩි නොවිය යුතු ය.

(6) කමිටුව විසින් එක් එක් පළාත් පළාත් පාලන ආයතනයක් වෙත වෙන් කර දීම සඳහා තීරණය කරනු ලබන මූලාධාර ප්‍රමාණය හැකි කඩිනමින් පළාත් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. එම තීරණය අමාත්‍ය මණ්ඩලය විසින් පිළිගත් බවට හෝ එම තීරණය පිළිබඳ කිසියම් වෙනස් කිරීමක් අවශ්‍ය වේ නම් නැවත සලකා බලා වාර්තා කරන ලෙසට හෝ කමිටුව වෙත දැනුම් දිය යුත්තේ ය.

*1992 අංක 5 දරණ මුද්දර ගාස්තු පැවරීම සඳහා වූ ප්‍රඥප්තිය බල රහිත වීම.*

5. මේ ප්‍රඥප්තියේ බලාත්මක වන වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් පසුව එන දින සිට, බස්නාහිර පළාතේ 1992 අංක 05 දරණ මුද්දර ගාස්තු පැවරීම සඳහා වූ ප්‍රඥප්තියේ විධි විධාන බල රහිත වන්නේ ය.

*අන්තර්කාලීන විධිවිධාන*

6. මේ ප්‍රඥප්තියේ පූර්වයෙන් ඇති විධිවිධාන වල කුමක් සඳහන් වුවද, 2009 වර්ෂයේදී එක් එක් පළාත් පාලන ආයතන වෙත, 2007 වර්ෂය තුල අය කරනු ලැබූ මුද්දර ගාස්තු ප්‍රමාණය ද 2010 වර්ෂයේදී 2008 වර්ෂය තුල අය කරනු ලැබූ මුද්දර ගාස්තු ප්‍රමාණය ද පදනම් කර ගනිමින් කමිටුව විසින් තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයක් මූලාධාර වශයෙන් පවරා දිය යුත්තේ ය.

*අනනුකුලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

7. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකුලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

*අර්ථ නිරූපනය*

8. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි,

"ආණ්ඩුකාරවරයා" යන්නෙන්, බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා අදහස් වේ.

"පළාත් සභාව" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් වේ;

"පළාත් පාලන ආයතන" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක්, ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතල වලට සමාන කාර්ය හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුලත් වේ;

"ලිත් වර්ෂය" යන්නෙන් ඕනෑම වර්ෂයක ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලය යන්න අදහස් වේ;

"ප්‍රධාන ලේකම්" යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන ලේකම් තනතුර දරන තැනැත්තා යන්න අදහස් වේ;

අනුමැතිය ලබා දෙමි
දින 2008.11.07
එස්. [illegible]
ආණ්ඩුකාරවර.
බස්නාහිර පළාත.

"අමාත්‍යවරයා" යන්නෙන් බස්නාහිර පළාතේ මුදල් විෂයය භාර අමාත්‍යවරයා යන්න අදහස් වේ;

"බස්නාහිර පළාත් සභා අරමුදල" යන්නෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන ප්‍රකාර පිහිටුවා ඇති බස්නාහිර පළාත් සභා අරමුදල යන්න අදහස් වේ;

"මුදල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්" යන්නෙන්, බස්නාහිර පළාතේ පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් තනතුර දරන තැනැත්තා යන්න අදහස් වේ;

"පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්" යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් තනතුර දරන තැනැත්තා යන්න අදහස් වේ;

"නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)" යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) තනතුර දරන තැනැත්තා යන්න අදහස් වේ;

"පළාත් අමාත්‍ය මණ්ඩලය" යන්නෙන් බස්නාහිර පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය අදහස් වේ;

"පළාත් පාලන කොමසාරිස්" යන්නෙන් බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස් තනතුර දරණ තැනැත්තා යන්න අදහස් වේ;

"පළාත් ආදයම් කොමසාරිස්" යන්නෙන් බස්නාහිර පළාත් සභාවේ පළාත් ආදයම් කොමසාරිස් තනතුර දරණ තැනැත්තා යන්න අදහස් වේ.

අනුඥාව ලබා දෙමි

දිනය 2008.11.07

එස්. අලවි මව්ලානා
ආණ්ඩුකාරවර.
බස්නාහිර පළාත.